Australian Government

COVID-19 VACCINATION

# COVID-19 එන්නත් සම්බන්ධයෙන් දරුවන් හට කථා කරන්නේ කෙසේද

අවසාන වශයෙන් යාවත්කාලීන කළේ: 2022 අගෝස්තු 8 වන දින

වයස මාස 6 සිට අවුරුදු 4 දක්වාවූ දරුණු ලෙස ප්‍රතිශක්තිකරණය හීනවූ, නැතිනම් ආබාධිතබවක් ඇති අය මෙන්ම, සිය COVID-19 ආසාදනය හේතුවෙන් දරුණු ලෙස රෝගාතුරවීමේ අවධානම ඇති සංකීර්ණ සහ/හෝ රෝගී තත්වයන් බොහෝමයක් ඇති අය හටද එන්නත නිර්දේශ කරයි. ඔබගේ දරුවා COVID-19 එන්නත් සම්බන්ධයෙන් කුතුහලය ඇතිවී බොහෝ ප්‍රශ්න ඇසීම සාමාන්‍යවේ. දරුවන් විසින් එන්නතක් ලබා ගැනීමට පෙර සහ පසුව ඔවුන් සමඟ කථා කිරීමට හෝඩුවාවන් කිහිපයක් මෙහි දක්වා ඇත.

Department of Health and Aged Care වෙබ් අඩවියේ එන්නත් සම්බන්ධ තොරතුරු සමඟ යාවත්කාලීනව සිටීම වැදගත්වේ.

ඔබට COVID-19 එන්නත සම්බන්ධයෙන් ඇති ප්‍රශ්න හෝ ගැටළු ඔබගේ දරුවාට එන්නත ලබා දෙන එන්නත් සපයන්නා හෝ ඔබගේ පවුලේ වෛද්‍යවරයා සමඟ එන්නත ලබාදීමට පෙර සාකච්ඡා කළ හැක.

ඔවුන්ගේ ප්‍රතිචාරවලට සවන්දීම සහ ඔවුන් විසින් එන්නත ලබා ගැනීම සම්බන්ධයෙන් ඇති බිය පිළිගත යුතුය.

- දැනට COVID-19 එන්නත සම්බන්ධයෙන් දන්නා දෙය මට පවසන්න.
- ඔබ කලින් කිසිදාක එන්නතක් ලබා තිබේද?

ඔබගේ දරුවා කලින් එන්නතක් ලබා තිබීමට බොහෝ ඉඩකඩ ඇති අතර එම අත්දැකීම එතරම් නරක විය නොහැක.

COVID-19 එන්නත සම්බන්ධයෙන් අවංකව සහ වයසට සරිලන ආකාරයට පහදා දෙන්න.

දරුවන් දෙමාපියන්ගෙන් භාවාත්මක පණිවුඩ ලබා ගත හැකි අතර අනවශ්‍ය බිය පෙන්වීම උචිත නොවන අතර ඒ මගින් දරුවන් අපහසුතාවයට පත්විය හැකිය.

වෛද්‍යවරයා හෝ වෛද්‍ය වෘත්තිකයා විසින් ඔබගේ දරුවාගෙන් සමහර ප්‍රශ්න අසන බව, ඔබගේ දරුවාගේ අතට ඉඳිකටුවක් ඇතුලත් කරන බව (ඔවුන්ගේ වයස මාස 6 සිට අවුරුදු 5 ට අඩු නම්), ඔවුනට අතට ඉඳිකටුවක් ඇනෙන බව දැනෙන බවත්, ඉඳිකටුව ඇතුලට ගිය ස්ථානව වඩා වැඩිපුර රිදෙන බවත් පහදා දෙන්න. ඉඳිකටුව ඇතුලට ගිය ස්ථානය වඩා වේදනාකාරී බව සාමාන්‍ය බවත් එයින් අදහස් වන්නේ බෙහෙත් වැඩ කරන බවත් පැහැදිලි කර දෙන්න.

ඔබගේ දරුවා එන්නත් ලබා ගැනීමට උනන්දු බව පෙන්වන්නේ නම්, ඔවුන්ගේ සිතුම් පැතුම් සොයා බලන්න, නැතිනම් අවශ්‍ය අවස්ථාවල ඔබගේ වෛද්‍යවරයාගෙන් වැඩිදුර උපදෙස් ලබා ගන්න.

## ඔබගේ දරුවා විසින් ඇසිය හැකි ප්‍රශ්නවලට පිළිතුරු

ඔබගේ දරුවා විසින් ඇසිය හැකි ප්‍රශ්න සම්බන්ධයෙන් දරුවන් හට උපකාරීවන පිළිතුරු සූදානම් කර තබා ගන්න. මෙම සංවාදයට උපකාර විය හැකි සමහර ප්‍රධාන ප්‍රශ්න සහ පිළිතුරු මෙහි දක්වා ඇත:

උපකාර වන බව ඔබ සිතයි නම්, දරුවාගේ මුතුන් මිත්තන් ආරක්ෂා කර ගැනීම, පාසැල් යාම සහ කණ්ඩායම් ක්‍රීඩා ආදී සත්‍ය උදාහරණ භාවිතා කරන්න.

ඕස්ට්‍රේලියාවේ බෙහෙත්, අදාල ඒජන්සිය මගින් හොඳින් පරීක්ෂා කර ඒවා ආරක්ෂාකාරීබවට වග බලා ගනී. ඒවා ආරක්ෂාකාරී නැතිනම් ඒවා මිනිසුන් හට ලබා නොදෙයි.

ඔබගේ දරුවා ඉඳිකටුවලට බිය නම්, ඵලදායී ලෙස සූදානම්වීම සහ අවධානය වෙනත් අතකට යොමු කිරීමේ උපක්‍රම වැදගත්වේ.

වයස අවුරුදු 5 සහ ඊට වැඩි දරුවන් හට, පළාතේ ෆාමසිය, හෝ වෛද්‍ය සායනය වැනි වඩා කුඩා කුඩා සහ පළපුරුදු ස්ථානයකට යාම වැදගත්වේ. විශාල ප්‍රමාණයේ එන්නත් මධ්‍යස්ථාන ශබ්දය අධික, කලබලකාරී සහ ආතතිය ඇතිකල හැකිය.

වඩා සක්‍රිය අත්දැකීමක් ලබාදීම සහ අවධානය වෙනතකට ගැනීම සඳහා දරුවාගේ වඩාත් ප්‍රිය කරන සෙල්ලම් භාණ්ඩ, රැගෙන එන්න.

ඔබගේ දරුවා ඉඳිකටුවලට බිය නම් එන්නත් සපයන්නා හට ඒ බව කල් තියා පැවසීම මගින් ක්‍රියාවලිය කලබලකාරී නොවන වැඩි වේලාවක් වෙන්කර තැබිය හැකිය.

එන්නත සම්බන්ධ වැඩි විස්තර සඳහා **Department of Health and Aged Care වෙබ් අඩවියේ** වන www.health.gov.au වෙත පිවිසෙන්න.

දුරකථන අංක **1800 020 080** ඔස්සේ ජාතික කොරෝනා වයිරස් සහ COVID-19 එන්නත් උපකාර මාර්ගය (National Coronavirus and COVID-19 Vaccine Helpline) ඇමතිය හැකිය. නොමිළේ භාෂා පරිවර්තන සේවා සඳහා 8 වන විකල්පය තෝරා ගන්න.

ඔබ බිහිරි, හෝ ශ්‍රවණ හෝ කථන අපහසුතා ඇතිනම්, දුරකථන අංක **133 677** ඔස්සේ ජාතික රිලේ සේවාව (National Relay Service) අමතන්න.